# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1721/30 - 2011 සැප්තැම්බර් 03 වැනි සෙනසුරාදා - 2011.09.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

පක්ෂ සාමාජිකත්වය අහෝසිවීම හේතු කොට ගෙන එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ (1) වගන්තිය යටතේ, සභාපති වන සාමිත්තම්බි ජීවරංගන් නම් වූ සභාපති අයත් වන්නා වූ තමිල් මක්කල් විඩුදලෛප් පුලිකල් නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ එරාවූර්පත්තු ප්‍රදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සිදම්බරපිල්ලයි විනෝද් මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි රත්නායක රාලලාගේ අසංක සතිස් කුමාර රත්නායක වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, සිදම්බරපිල්ලයි විනෝද් මහතා එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

අසංක රත්නායක,
තේරීම්භාර නිලධාරි,
එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාව.

2011 අගොස්තු මස 18 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
මඩකලපුව.

09 - 587/1


1A - G 15022 — 345 (2011/09)

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහෝසිවීම හේතු කොට ගෙන එරාවූර්පත්තු ප්‍රාදේශීය සභිකයෙකුගේ සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

සාමිත්තම්බි ජීවරංගන් නම් වූ සභිකයා අයත්වන තමිල් මක්කල් විඩුදලෛප් පුලිකල් නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් ඒ එරාවූර්පත්තු ප්‍රදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා අඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65 අ (2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩු පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන කන්දයියා මහාලිංගම් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි රත්නායක රාලලාගේ අසංක සතිස් කුමාර රත්නායක වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, කන්දයියා මහාලිංගම් මහතා එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

අසංක රත්නායක,<br>
තේරීම්භාර නිලධාරි,<br>
එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාව.

2011 අගොස්තු මස 18 වැනි දින,<br>
මැතිවරණ කාර්යාලය,<br>
මඩකලපුව.

09 - 587/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.